# ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දරිද්‍රතාවය




සැකසුම : කේ.යූ . අයි විජේවර්ධන

සංවර්ධන නිලධාරී


මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය

# ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දරිද්‍රතාවය

දරිද්‍රතාවය හෙවත් දිළිඳුකම ගෝලීය සමාජය වෙලාගත් දරුණුතම ප්‍රශ්නයක් මෙන් ම බෙහෙවින් සංකීර්ණ සංකල්පයකි. බලයට පත් වන සෑම රජයක්ම දිළිඳු බව තුරන් කිරීම පිණිස නොයෙක් ක්‍රියාමාර්ග ගනු ලැබුව ද දිනෙන් දින වර්ධනය වන දිළිඳුකම ඉදිරියේ ඒ සියලු ක්‍රියාමාර්ග අභියෝගයට ලක් වී තිබේ. 2025 වන විට අන්ත දිළිඳුකම ලෝකයෙන් තුරන් කිරීම ජාත්‍යන්තර තලයේ ඉලක්කය වී ඇත.

දරිද්‍රතාවය පිළිබඳ විවිධ මානයන් දැකිය හැකි අතර පුද්ගලයකු ලබන ආදයම් තත්වයේ මට්ටම අනුව මෙම මානයන් තීරණය වේ. ලෝකයේ අන්ත දරිද්‍රතාවය ලෙස අරුත් ගන්වන්නේ පුද්ගලයකුගේ දිනක ආදායම ඇමරිකානු ඩොලර් 1.90 ක් හෝ ඊට වඩා පහළ ආදායම් තත්වයකි. (විකිපීඩියා- නිදහස් විශ්වකෝෂය)




ශ්‍රී ලංකාවේ දිළිඳුකම මූලික වශයෙන් ග්‍රාමීය ගැටලුවක් බවට වර්තමානයේ දී පත් වී ඇත. ලංකාවේ සමස්ත දිළිඳු ජනතාවගෙන් 90 % කට වඩා සංකේන්ද්‍රණය වී ඇත්තේ ග්‍රාමීය හෝ වතු ප්‍රදේශවලය. ආර්ථික වශයෙන් යම් යම් ඉහළ ශීර්ෂ වලට අප රට මෑත භාගයේ දී පැමිණිය ද ග්‍රාමීය අංශයේ දරිද්‍රතාවයට සාර්ථක විසඳුම් දීමට මෙතෙක් හැකියාවක් ලැබී නැත. ඒ නිසාම ග්‍රාමීය දරිද්‍රතාවය මෙරට විශාල ගැටලුවක් වී ඇති අතරම එය අවම කිරීම සඳහා රජය විසින් ද විවිධ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. ශ්‍රී ලංකාව තුළ පවතින ග්‍රාමීය දිළිඳුකම අවම කිරීමට නම් දිළිඳුකමට එරෙහිව කටයුතු කළ යුතු ආකාරය ගැන මනා අවබෝධයක් තිබීම අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකාව තුළ දරිද්‍රතාවයෙන් පෙළෙන්නන්ගේ ආර්ථික සමාජීය තත්වය කෙසේ ද, ඔවුන් දිළිඳු වී ඇත්තේ ඇයි, දිළිඳු බවින් මිදීමට ඔවුන් සඳහා කළ හැක්කේ කුමක් ද, යන්න දැනුවත් වීම ඉතා වැදගත් වේ.

2019 හා 2020 වර්ෂයන් මූලික කර ගනිමින් ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් දිස්ත්‍රික් මට්ටමින් මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා පුද්ගලයකුගේ මසකට වැයවන මුදල පිළිබඳ සමීක්ෂණයක් සිදු කරන ලදී.

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව පුද්ගලයක්ගේ මාසික වියදම සඳහා රු 5047 ක මුදලක් අවශ්‍ය වේ. නවතම සංඛ්‍යා ලේඛන අනුව දිස්ත්‍රික්ක 09 ක් දරිද්‍රතා රේඛාවට ඉහළින් ඇති අතර දිස්ත්‍රික්ක 15 ක් ඊට වඩා පහළ මට්ටමක ඇති බවත් එක් දිස්ත්‍රික්කයක් සමාන බවක් පෙන්නුම් කෙරේ. දිස්ත්‍රික්ක අතරින් වැඩිම මාසික වියදම රු 5478 ක් කොළඹ දිස්ත්‍රික්කයේ වන අතර අඩුම මාසික වියදම රු 4752 ක් මොණරාගල දිස්ත්‍රික්කයේ ය.

සමාජීය විද්‍යා විශ්වකෝෂයට අනුව දිළිඳුකමේ අර්ථ තුනක් දක්වා ඇත.එනම්,

I. සමාජීය දිළිඳුකම
II. සදාචාරමය දිළිඳුකම
III. අන්ත දිළිඳුකම

**සමාජීය දිළිඳුකම**

සමාජීය දිළිඳුකමට දේපල, ධනය, ජීවන මට්ටම ආදී ආර්ථික සාධක වල අසමානතාව මෙන්ම අසම්මත පහත් සමාජ මත යැපීම සුරාකෑමට බඳුන් වීම සමාජයෙන් කොන්වීම ආදී විවිධ කරුණු ඇතුළත් වේ.

**සදාචාරමය දිළිඳුකම**

සදාචාරමය දිළිඳුකම යනු සමාජයේ හෝ එහි උප සංස්ථා සමූහ ආදියේ පවත්නා අගනාකම් පද්ධතිය තුළ දිළිඳුකමට ඇති ස්ථානයයි.

**අන්ත දිළිඳුකම**

අන්ත දිළිඳුකම යනු තමන්ගේ ජීවන නඩත්තුව කිසිසේත්ම පවත්වාගෙන යාමේ හැකියාවක් නොමැති වීමයි. එනම් ආහරණ, ඉඳුම්හිටුම්, ඇඳුම්පැළඳුම් ආදිය උපයා ගැනීමට නොහැකි වීමයි.

ගැමි සමාජය දිළිඳුකම හඳුන්වා දී ඇති ආකාරයට "දවසට හොඳ ආහාර වේලක්, අඳින්න ඇඳුමක්, ණය නොවී සිටීමට ආදායම් මාර්ගයක්, වගා කිරීමට ඉඩමක් ඇත්නම්" දිළින්දෙකු නොවන බවයි. ආර්ථික විද්‍යාත්මක විග්‍රහයට අනුව දිළිඳුතම යනු ආදායම් අඩුකම නිසා ජීවන මාර්ගයක් නොමැති වීමෙන් ඇති වූ ප්‍රතිඵලයක් ලෙසයි.


මැලේසියාවේ හිටපු අගමැතිවරයෙක් වූ මහතීර් මෙහොමඩ් වරක් ලංකාවේ දී ප්‍රකාශ කරන ලද්දේ "ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දී ප්‍රධානත්වය දිය යුත්තේ දිළිඳුකම පිටු දැකීමට සහ සියලු ජාතීන් අතර සමානාත්මතාවය ඇති කිරීම සඳහා බවයි" .මෙම ප්‍රකාශය මඟින් මෙරට දිළිඳුකම නැති කිරීමට ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය තුළ දී ප්‍රමුඛතාවයක් දිය යුතු බව දක්වා ඇත.

දරිද්‍රතාවය යනු සරල වශයෙන් ම දුප්පත්කමයි. රටක ග්‍රාමීය සමාජ ක්‍රමයක් හා නාගරික සමාජ ක්‍රමයක් වශයෙන් පවතින අතර ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දරිද්‍රතාවය ඉහළ මට්ටමක පවතී. දරිද්‍රතාවය බොහෝ රටවල තම සංවර්ධන ඉලක්ක කරා යෑම සඳහා විශාල බාධාවකි. ලෝකයේ ඇතැම් රටවල දරිද්‍රතාවය උග්‍ර ගැටලුවක් වීම නිසා මියයන පිරිසක් ද සිටී. උදාහරණ ලෙස සෝමාලියාව, ඉතියෝපියාව, සුඩානය ආදී රටවල් හැඳින්විය හැක.

දිළිඳු අය සංකේන්ද්‍රණය වී ඇති ආර්ථික ක්‍රියාකාරිත්වය ක්ෂේත්‍ර 06 ක් ඔස්සේ දැක්විය හැකිය.

- ඉඩම් නැති කෘෂිකාර්මික කම්කරුවන්
- පවුල් ශ්‍රමය යොදා ගනිමින් ආහාර භෝග වගා කරන සුළු ඉඩම් හිමි ගැමියන්
- ධීවර හා සත්ව පාලන ක්ෂේත්‍රය
- බොහෝවිට ගෘහස්ථ කර්මාන්ත මට්ටමේ සුළු පරිමාණ කර්මාන්ත වල නියුතු වුවන්
- පෞද්ගලික සහ අනෙකුත් කටයුතු වල නියැලි සුළු වෙළඳුන් සහ ස්වයං රැකියාවන්හි නියුතු වුවන්
- පෙදරේරුවන් වඩුවන් වැනි පෞද්ගලික කටයුතු කරන ශිල්පීන්

**<u>දරිද්‍රතාවය ඇති වීමට හේතු</u>**




**<u>ග්‍රාමීය දරිද්‍රතාවය අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග</u>**

- දරිද්‍රතාවය අවම කර ගැනීම සඳහා ග්‍රාමීය ප්‍රදේශවල වඩා හොඳ මාර්ග පද්ධතියක්, ප්‍රවාහන පහසුකම්, නව තාක්ෂණ ක්‍රමවේ ද ඇති කළ යුතුය.
- බොහෝ දෙනෙක් කෘෂිකර්මාන්තයේ හා ස්වයං රැකියා වල යෙදෙන අතර ඒ සඳහා අවශ්‍ය ණය පහසුකම් ලබා දීම.
- විශ්‍රාම වැටුප්, ආබාධිතයින් සඳහා වන දීමනා, සමෘද්ධි දීමනා හා අලාභ වන්දි ගෙවීම් ආදී සමාජ ආරක්ෂක ආවරණ ලබා දීම.
- දුප්පත් ජනතාව හඳුනාගෙන ඔවුන්ව නිශ්චිත සංවර්ධන වැඩ පිළිවෙළකට යොමු කිරීම.
- ග්‍රාමීය ජනතාවගේ අධ්‍යාපන තත්වය පිළිබඳ සැලකීමේ දී එය ඉතා පහළ මට්ටමක ඇති අතර ඒ සඳහා පාසල් පහසුකම් වැඩි දියුණු කිරීම, පාසල් අතර අසමානත්වය දුරලීම හා පාසල් අධ්‍යාපනය සඳහා දිරිමත් කිරීම සිදු කළ යුතුය.

මූලාශ්‍ර :- ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව - Official poverty line by District : June 2020